# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2243/14 - 2021 සැප්තැම්බර් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2021.09.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක 77

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම ආනයනකරුවෙකු, සැපයුම්කරුවෙකු, නිෂ්පාදකයෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් පහත දක්වා ඇති සහල් වර්ග එහි සඳහන් කර ඇති උපරිම මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, සැපයීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *වර්ගය* | *උපරිම සිල්ලර මිල* |
|---|---|
| කීරි සම්බා | කිලෝ ග්‍රෑම් 1ක් රු. 125 |
| සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (සුදුරු සම්බා හැර) | කිලෝ ග්‍රෑම් 1ක් රු. 103 |
| සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (මොට්ටෙයිකරුපන් සහ අට්ටික්කාරි හැර) | කිලෝ ග්‍රෑම් 1ක් රු. 98 |
| සුදු/රතු කැකුළු සහල් | කිලෝ ග්‍රෑම් 1ක් රු. 95 |

1A - G 34539 — 120 (2021/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තවද, ඉහත සඳහන් සහල් වර්ග ආනයනකරුවන්, සැපයුම්කරුවන්, නිෂ්පාදකයින්, බෙදාහරින්නන්, හෝ වෙළෙඳුන් විසින්, එකී සහල් වර්ග ඇසුරුම්/බහාලුම්වල අසුරා, විකිණීම, සැපයීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කරනු ලබන්නේ නම් එවිට, අදාළ ඇසුරුම්/බහාලුම් කරන ලද සහල්වල බර සඳහා වන මිල හැර වෙනත් කිසිදු අතිරේක අයකිරීමක් කළ නොහැකි බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියෝගය 2021 සැප්තැම්බර් මස 02 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් 2020.05.28 වැනි දින *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 2177/9 හි පළ කරන ලද නියෝග අංක 66 මෙමගින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික),**
සභාපති.

2021 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.